පෙරදිග සංගීතය - 7 ශ්‍රේණිය (සාමාන්‍ය පාඩම) - 2 වාරය - 1

***උපදේශාත්මක ගී***

ගීතය මඟින් යම් පණිවිඩයක්, උපදේශයක් ලබා දෙන ගී උපදේශාත්මක ගී යනුවෙන් හැඳින්විය හැකි ය. සමාජය යහපත් මගට යොමු කරවන සාර ධර්ම , සිරිත් විරිත් , වැඩිහිටියන් විසින් ලබා දුන් ආප්තෝපදේශ යන කරුණු ඇතුළත් උපදේශාත්මක ගීත ගායනය කිරීමෙන් ජීවිතය ඵලදායී වේ.

උදා-

- නොමඟ නොයන් පුතේ
- හිතන්නකෝ අයියේ...
- සමන් වැලේ මල් ජයට පිපීලා......
- පාන්කිරිත්තා තක්කිට තරිකිට
- මව්පියො ආදී සොඳුරු තමාගේ
- අහන්න මගේ හොඳ පුංචි පුතේ
- දූ පුතුනේ රට අපේ ය
- කරුණාව සමග හොඳ හිත පතුරන්න

නොමඟ නොයන් පුතේ ඔබට රටක් ඇතේ<br>රටේ දියුණු සැදුම නුඹට බාර යි මගෙ පුතේ<br>බාර යි මගෙ පුතේ<br>යෝධ මහල් නැහැ කවදත් එක දවසින් තැනුණේ<br>ගඩොළින් ගඩොළක් තබලා සෙමින් සෙමින් බැඳුණේ<br>සෙමින් සෙමින් බැඳුණේ<br>දුර නොබලා ඉක්මන් වී නෑ නෑ පල ලැබුණේ<br>යන්නෙ කොහේ දැයි නොම දැන<br>නොයන් ගමන් පුතුනේ<br>අද කැඩු දේ හෙට ඕනෑ විය හැකි වන නිසා<br>රටට උරුම කිසි ම දෙයක් බිම නොදමන් නසා<br>බිම නොදමන් නසා<br>තරුණ සවිය රට නැගුමට යොදනු හොඳින් සිතා<br>ඔබේ උපන් බිම කවදත් ඔබට යි මගෙ පුතා<br>ඔබට යි මගෙ පුතා

පද රචනය- ජෝර්ජ් ලෙස්ලි රණසිංහ<br>තනු - ආචාර්ය දයාරත්න රණතුංග<br>ගායනය- විල්බට් ඇන්තනි

**පැවරුම -**

- උපදේශාත්මක ගීත හොඳින් අසා රසවිඳින්න. ගායනය කිරීමට පුහුණු වන්න.
- උපදේශාත්මක ගීත ඇතුළත් පොත් පිංචක් සකස් කරන්න.